## පිළිතුරු පත්‍රය I

| | | | |
|---|---|---|---|
| 1. iv | 11. iv | 21. iv | 31. i |
| 2. iii | 12. ii | 22. iii | 32. iii |
| 3. ii | 13. All | 23. i | 33. iv |
| 4. i | 14. i | 24. ii | 34. i |
| 5. ii | 15. ii | 25. iii | 35. ii |
| 6. iii | 16. iii | 26. iv | 36. iii |
| 7. iv | 17. ii | 27. i | 37. iv |
| 8. i | 18. i | 28. iii | 38. i |
| 9. iii | 19. iii | 29. iv | 39. ii |
| 10. i | 20. ii | 30. ii | 40. iii |

### දෙවන පත්‍රයේ පිළිතුරු

1. I. අන්තර් පුද්ගල සන්නිවේදනය

II.
- පුද්ගලයන් දෙදෙනෙකු වරින්වර ග්‍රාහකයා හා සන්නිවේදකයා ලෙස පෙනී සිටියි.
- ප්‍රතිපෝෂණය සාපේක්ෂව වේගවත් වේ. (අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට වඩා අඩුවේ.)
- සන්නිවේදන බාධක අවම කර ගැනීමට හැකිවේ.
- සන්නිවේදනය අභිමුඛ හෝ අභිමුඛ නොවී සිදුවේ.

III.
- සක්‍රීයව පණිවිඩය ගලායයි.
- දෘශ්‍යය, ලිඛිත, වාචික, අවාචික හා ශ්‍රව්‍ය යන විධි දැකිය හැක.
- කියවීමට නොහැකි පුද්ගලයන් සඳහා ඇසීමෙන් හා බැලීමෙන් ග්‍රහණය කර ගත හැක.
- නැවත පරිශීලනය සඳහා අමතර වියදම් දැරිය යුතුය.
- දැන්වීම විකාශනය වන මොහොතේම ග්‍රහණය කරගත යුතු වීම.

IV.
- අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව.
- තාත්වික බව නිසා ග්‍රාහක විශ්වාසනීයත්වය දිනා ගැනීමට හැකිවීම.
- පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට හැකිවීම.
- පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව.
- ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව.

V. SMS, විද්‍යුත් තැපැල (Email), වෙබ් අඩවි (website), අන්තර්ජාලයේ පළ කරනු ලබන පුවත්.

VI. පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය

VII. අංකිත රූපවාහිනී තාක්ෂණය හඳුන්වාදීම.
චන්ද්‍රිකා රූපවාහිනි තාක්ෂණය හඳුන්වාදීම.
ත්‍රිමාන රූපවාහිනී තාක්ෂණය හඳුන්වා දීම.

VIII. ශ්‍රව්‍ය - ගුවන්විදුලිය - ශ්‍රාවකයා / අසන්නා
ශ්‍රව්‍ය - දෘශ්‍යය - රූපවාහිනිය - ප්‍රේක්ෂකයා / නරඹන්නා

IX. අන්තර්ජාලයෙහිම පමණක් ම පළ කෙරෙන විද්‍යුත් පුවත්පත. (Online edition)

X. විශේෂාංග ලිපි රචකයා සතුව
- පුවත් ඉව
- අසාමාන්‍ය හා සුවිශේෂ තොරතුරු ග්‍රහණය කර ගැනීමේ හැකියාව.
- නිර්මාණශීලී ආකෘති යොදා ගැනීම.

2. I. වාචික සන්නිවේදනය, අවාචික සන්නිවේදනය, දෘශ්‍ය සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය ලිඛිත සන්නිවේදනය.

II.
- සිතීම විධිමත් කිරීම.
- සැබෑව හඳුනාගැනීම.
- දැනුම සංරක්ෂණය.
- පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම.
- වාචික ප්‍රකාශනය.
- කාලය සන්නිවේදනය.

III.
- ව්‍යාකරණානුකූල වීම.
- අක්ෂර වින්‍යාසය සහිතවීම.
- අකුරුවලට හැඩයක් තිබීම.
- විරාම ලක්ෂණ යෙදිය යුතුය.
- ලිවීමේදී වචන ඈත් කර විය යුතුය.
- එක් වචනයක් තවත් වචනයකින් වෙන් කර දැක්විය යුතුය.
- එක් ජේදයක් තවත් ජේදයකින් වෙන් කර දැක්විය යුතුය.

IV. යම් සංවිධානයක් තුළ ක්‍රියාත්මක වන විධිමත් සන්නිවේදනයෙන් බැහැරව සිදුවන සියලු තොරතුරු හුවමාරු කිරීම්, අවිධිමත් සන්නිවේදනයට අයත් වේ.

අවිධිමත් සන්නිවේදන ආකෘති


- තනිදාමය
- ඕපාදූප දාමය
- සම්භාවිතා දාමය
- පර්ෂද දාමය

(රූප සටහන් ඇද විස්තර කර තිබිය යුතුය.)

3. I. එක් දිශාවකට පමණක් යොමුවන සන්නිවේදනය.

II. මෙහිදී සන්නිවේදන හා ග්‍රාහක භූමිකාවන්හි වෙනසක් සිදු නොවෙයි.

III. ද්විමාර්ගික සන්නිවේදන ක්‍රියාවලිය.




සන්නිවේදන ක්‍රියාවලිය අංග සම්පූර්ණ වන්නේ ග්‍රාහකයාගේ ප්‍රති පෝෂණය ලැබීමෙනි. ග්‍රාහකයා සන්නිවේදකයා බවටත්, නිවේදකයා ග්‍රාහකයා බවටත් කාර්ය මාරුකර ගැනීම ද්විමාර්ගික, චක්‍රීය සන්නිවේදන ක්‍රියාවලියේදී සිදුවේ. මෙය ද්විමාර්ගික සන්නිවේදන ක්‍රියාවලියකි.

IV. දෘඪ පුවත් - විශාල පිරිසකට බලපෑමක් ඇති කළ හැකි ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ වැදගත්කමකින් යුත් කාලීන වටිනා කමක් සහිත පුවත් "දෘඪ පුවත්" ලෙස හැඳින්වේ.
බොහෝ විට දිනපතා පුවත්පත්වල මුල් පිටුවේ ඇත්තේ දෘඪ පුවත්ය. රජය විසින් ගනු ලබන තීරණ, හදිසි ආපදා තත්ත්ව, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික වැදගත්කමකින් යුතු දේ උදාහරණ ලෙස දැක්විය හැකිය.

මෘදු පුවත් - සමාජයට බලපෑමක් ඇති නොකරන එහෙත් වැඩිදෙනාගේ අවධානය හා කැමැත්ත දිනා ගන්නා, මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන පුවත් මෘදු පුවත් ලෙස හැඳින්වේ.

4. I. මාණ්ඩලික මාධ්‍යවේදීන් වෘත්තීය මාධ්‍යවේදීන් ලෙස සැලකේ. එනම් ඔවුහු එම ජනමාධ්‍ය ආයතනයේ මාසික වැටුප් ලබන මාධ්‍යය ශ්‍රමිකයන්ය.
ප්‍රාදේශීය මාධ්‍යවේදීන් යනු අර්ධ කාලීන වශයෙන් යම් ජනමාධ්‍ය ආයතනයකට තම සේවාව සපයන එම මාධ්‍ය ආයතනය සමඟ ගිවිසුම් ගත ව සිටින, තමන් කරන සේවාව වෙනුවෙන් පමණක් ගෙවීම් ලබන මාධ්‍ය ශ්‍රමිකයන්ය.

II. ආයතනික මූලාශ්‍ර රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් ඕනෑම සමාජ සංවිධානයක් විය හැකිය.

උදාහරණ - රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු
පෞද්ගලික කර්මාන්ත ශාලා
සුබ සාධක සංගම්
රාජ්‍ය නොවන සංවිධාන

III. ගුවන් විදුලි වැඩසටහන් සඳහා පහත සඳහන් ආකෘති යොදාගත හැක. කථා, සම්මුඛ සාකච්ඡා, සාකච්ඡා, සංවාද, වාර්තාමය, විචිත්‍රාංග, සඟරාමය, ගුවන් විදුලි නාට්‍ය, සජීවී විස්තර ප්‍රචාර, වාර්තාකථන, නිවේදන, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, දුරකතන සංවාද, ප්‍රවෘත්ති වැඩසටහන්, සංගීත වැඩසටහන්. (මෙම ආකෘති වලින් දෙකක් හඳුන්වන්න)

IV.
- ගුවන් විදුලිය හුදෙක් ශබ්දය පාදක වූ මාධ්‍යයකි.
- ගුවන් විදුලි වැඩසටහන් කනට ඇසෙන්නේ එක්වරක් පමණි.
- අසන්නාගේ අවධානය ගුවන් විදුලි වැඩසටහනකින් ඉවතට යොමු වීමට ඇති ඉඩකඩ වැඩිය.
- ගැඹුරු සංකීර්ණ අදහස් ග්‍රාහකයාගත කිරීමේ අපහසුතාවය.


(මින් දෙකක් විස්තර කර තිබිය යුතුය.)

5. I. තොරතුරු සැපයීම, අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය ලබාදීම, පෙළඹවීම, සමාජානුයෝජනය, සංවාද හා සාකච්ඡා, සංස්කෘතික ප්‍රගමනය. (මින් හතරක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය)

II. දින මුද්‍රා යන්ත්‍රණය, නිල මුද්‍රාව, ගණක යන්ත්‍රය, පරිගණකය, මුදල් සටහන් යන්ත්‍රය, තැපැල් මුද්‍රා යන්ත්‍රය, මුදල් ගණින යන්ත්‍රය.

III.
- තොරතුරු පහසුවෙන් ඉදිරිපත් කළ හැකිවීම.
- තොරතුරු රාමුගතව ඉදිරිපත් කළ හැකිවීම.
- පිටු ප්‍රදර්ශනය පිළිවෙලකට සිදු කළ හැකිවීම නිසා පාඨම පහසුවෙන් අවබෝධ කරගත හැකිවීම.
- අවම පිරිවැයකින් නිර්මාණය කර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගත හැකිවීම.

IV. ප්‍රවෘත්ති වාර්තාකරණයේදී යොදා ගන්නා යටිකුරු පිරමීඩ ආකෘතිය.




(මෙම ආකෘතිය විස්තර කර තිබිය යුතුය.)

6. I. පොත්, පුවත්පත්, සඟරා, පෝස්ටර්, අත්පත්‍රිකා

II. පොතක ISBN අංකය මගින් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වේ ශ්‍රී ලංකාවේ පළවන පොතකට ISBN අංකය ලබා දෙනුයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගිනි.

III. • බ්‍රෝඩ් ෂීට් (Broad Sheet) • ටැබ්ලොයිඩ් (Tabloid)

බ්‍රෝඩ් ෂීට් පුවත්පත -
පළල් පිටු සහිත පුවත්පත්. මෙය සම්ප්‍රදායික පුවත්පත් ප්‍රමාණයයි. ජාතික මට්ටමේ ප්‍රවෘත්ති පළවන උසස් ප්‍රමිතියේ ජනසන්නිවේදන ක්‍රියාකාරකම් අන්තර්ගත වූ පුවත්පත්.

ටැබ්ලොයිඩ් පුවත්පත - බ්‍රෝඩ් ෂීට් පුවත්පතක පිටුවක හරි අඩක විශාලත්වයෙන් යුත් පුවත්පත් ටැබ්ලොයිඩ් පුවත්පත වෙයි. ජාතික පුවත්පත් සමග ටැබ්ලොයිඩ් පුවත්පත් බෙදා හැරීම සිදුකරයි. ඡායාරූප වැඩි ප්‍රමාණයක් අන්තර්ගත කරයි. සරල හා ආකර්ෂණීය ආකෘති.

IV. මධ්‍යම තරංග, කෙටි තරංග, සංඛ්‍යාංග මූර්ජන තරංග
මෙම තරංග මාර්ගයන් මගින් කටහඬ විද්‍යුත් චුම්බක තරංගයක් බවට පත්කර ශ්‍රාවකයා වෙත ගෙන යයි. ගුවන් විදුලි මධ්‍යස්ථාන සිය සම්ප්‍රේෂණ කටයුතු සඳහා මෙම තරංග මාර්ගයන් යොදා ගනු ලබයි.

7. I. මැදිරි නිෂ්පාදන, සජීවී ඉදිරිපත් කිරීම, බාහිර පටිගත කිරීම.

II.

| | | |
|---|---|---|
| ඒකාංගික නාට්‍යය | - | එක කොටසකින් අවසන් වේ. |
| ප්‍රසංගික නාට්‍ය | - | කොටස් ගණනාවක් දැකිය හැක. |
| විවිධාංගික නාට්‍ය | - | කොටසින් කොටස කතාවේ තේමාව වෙනස් වේ. |
| මෙගා ටෙලි නාට්‍ය | - | මෙය නව නාට්‍ය ප්‍රභේදයකි. අඩු වියදමකින් කොටස් වැඩි ගණනක් සහිතව නිර්මාණය වේ. |

(ඉහත ප්‍රභේද 4න් 3ක් නම් කිරීම ප්‍රමාණවත්ය.)

III. නූතන රූපවාහිනියේ වඩාත් ජනප්‍රියම රූපවාහිනිය විචිත්‍රාංගය ලෙසින් යථාකාර රූපවාහිනි (Reality TV) වැඩසටහන් හැඳින්විය හැක. රූපවාහිනී වැඩසටහන් ක්‍රියාවලියෙහි තිබූ වෘත්තීය සීමා හා සෞන්දර්යාත්මක නියම වෙනස් කරමින් නව ආකාරයක රූපවාහිනී වැඩසටහන් සංස්කෘතියක්.
උදාහරණ - හිරු ස්ටාර්, ඩ්‍රීම් ස්ටාර්, සුපර් ස්ටාර් .............

IV. චිත්‍රපටයේ මුල් යුගය නිහඬ සිනමා යුගය ලෙසින් හැඳින්වේ. නිහඬ සිනමාව තුළ ප්‍රධාන හා විශිෂ්ට රංගධරයා වූයේ Charlie Chaplin ය. ඔහු රඟපාන ලද සිනමා පටයන් තුළ රූපය ප්‍රමුඛ විය. මෙම සිනමාව තුළ රූපය සමඟ හඬ මුසු කිරීම සිදු නොකරන ලද අතර, රංගන ශිල්පීන්ගේ හැකියාව උපරිම වශයෙන් ප්‍රදර්ශනය කරන සිනමාවකි.